# වික්ටෝරියා ජාන ආධාර ජාලයේ (GSNV) සාමාජිකත්වය

අපේ සේවාවන් ලබා ගැනීම සඳහා ඔබ GSNVහි සාමාජිකයෙකු වීම අත්‍යවශ්‍ය නොවුනත්, මෙම ජාලයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් පහත දැක්වෙන වාසි අත්වේ:

- GSNV පුවත්හසුන. මෙහි ඉදිරියට පැවැත්වීමට නියමිත සිදුවීම්, මූල්‍ය සම්පාදන ලබාගැනීමේ අවස්ථා, සහ අන් නොයෙකුත් දේ ගැන තොරතුරු සම්භාරයක් ඇතුලත්වේ
- නොමිලේ කාමර පහසුකම් (කාර්ය මණ්ඩල වැඩෙහි යෙදවිය හැකි වේලාවලදී) සහ සම්මන්ත්‍රන සහ රැස්වීම් සඳහා උපකරණ
- GSNV සම්මන්ත්‍රන සහ රැස්වීම් වලට ලියාපදිංචිවීමේ ගාස්තු සඳහා වට්ටම්
- අපගේ සුලු දීමනා ක්‍රමය සඳහා ඉල්ලුම් කිරීමේ අයිතිය
- කමිටු පදවි සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට අයිතිය

මෙයට බැදෙන්නේ කෙසේද?
මේ සමග ඇති සාමාජික ඉල්ලුම්පත පුරවා Victorian Clinical Genetics Services වලට ගෙවන ලෙස ලියූ චෙක්පතක් සමග පහත ලිපිනයට එවන්න:

Genetic Support Network of Victoria
Post Office Box 1100
Parkville Victoria 3052

GST බද්ද මිලට ඇතුලත් වේ

අප ඔබගේ පරිගණක යන්ත්‍රයට සමීපව සිටින්නෙමු
www.gsnv.org.au

එසේ නැතිනම් අපට ඊමේලයක් එවන්න
info@gnsv.org.au

එසේ නැතිනම් අපට දුරකථනයෙන් අමතන්න
(03) 8341 6315
[පෙනීමේ සහ ඇසීමේ ආබාධ ඇති අය සඳහා TTY දුරකථන සහ ප්‍රාදේශීය අමතන්නන් සඳහා ආපසුඇමතුම් callback පහසුකම් ඇත]

නැතහොත් අපට ෆැක්ස් පණිවුඩයක් එවන්න (03) 8341 6390

නැතිනම් පැමින අපව හමුවන්න
10 වන මාලය
The Royal Children's Hospital
Flemington Road
Parkville, Victoria 3052

Genetic Support Network of Victoria

“තොරතුරු, උපකාර සහ උපදෙස් ජාලය තුලින් ජාන අභියෝගතාවන්ට එරෙහිව  මුහුනදීම සඳහා මහජනතාව ශක්තිමත් කිරීම”

කරුනාකර කුනු කසල දැමීමෙන් වලකින්න

ERC 060746



# වික්ටෝරියා ජාන ආධාර ජාලය

Sinhalese



## තොරතුරු

ඔබේ මනාපය අපට දුරකථනයෙන් ඇමතීමට වුවත්, අපේ වෙබ් අඩවියට පිවිස තොරතුරු සොයාගැනීමට වුවත්, එසේ නැතිනම් අපේ අලුත්ම ප්‍රකාශන කියවීමට වුවත් ඔබට අවශ්‍ය තොරතුරු ඊට උචිත තොරතුරු සපයන්නෙන්ගෙන්, නිවැරදිව, කලට වේලාවට ඔබට සැපයීමට අපට පුළුවන.

මේ ගැන අපෙන් අහන්න:

- ආධාර කණ්ඩායම්වල සන්නිවේදන තොරතුරු
- ප්‍රජා සම්පත්
- ජාන ආබාධ
- උණුසුම් මාතෘකා
- ආධාර කණ්ඩායම් සඳහා තොරතුරු සහ සම්පත්
- ආධාර කණ්ඩායම් ස්ථාපිත කිරීම
- තවත් නොයෙකුත් දෑ!

අදහස් සහ තොරතුරු හුවමාර කරගනු පිනිස දැනට ස්ථාපිත ආධාර කණ්ඩායම් සමග ඔබව සම්බන්ධ කරදීමටත්, ඔබේ ආබාධයෙන් පෙලෙන අනිකුත් පවුල් හා ඔබව සම්බන්ධ කරවීමටත් අපට පුළුවන.

## උපදෙස්

GNSVහි අභිප්‍රාය ජාන ආබාධ වලින් පෙලෙන අය සඳහා ශක්තිමත් හඬක් සපයාදීමයි. සාමාජිකයන් නියෝජනය කිරීමෙන්, සහ ඔවුන්ගේ අයිතිවාසිකම්වල උන්නතිය සඳහා පුළුල් ජනතාවද, ප්‍රාන්ත සහ ෆෙඩරල් ආණ්ඩුද උනන්දු කරවීම තුලින්ද, සාමාජිකයන් සහ සෞඛ්‍ය සේවා සපයන්නන් අතර සබඳතා ඇතිකිරීම මගින්ද මෙම අභිප්‍රාය ලඟාකරගනු ලැබේ.

## ආධාර

ජාන ආබාධ වලින් පෙලෙනවුන් හා ඔවුන්ගේ පවුල් සඳහා කරුණාවන්ත, හිතවත්, පහසුවෙන් ළඟාවියහැකි සහ තතු දන්නා හමුවීම් පොළක් අප සපයා දෙන්නෙමු. මහජනයාට යෝග්‍ය සහ කාලෝචිත ආධාර ලබාදීම සහ ආධාර කණ්ඩායම් වලට උපකාර කිරීම GSNVහි අරමුණයි.

## අධ්‍යාපනය

සාමාජිකයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කරගැනීම පිනිස වැඩ මුළු සහ සම්මන්ත්‍රන වැනි අධ්‍යාපනික අත්දැකීම් ඉදිරිපත් කිරීම GNSVහි අරමුණයි. මේ අතරට මූල්‍ය දීමනා සඳහා ඉල්ලුම්කිරීම පිලිබඳවැඩ මුළු, සහ නිශ්චිත ආබාධ හෝ නව වෛද්‍ය සොයාගැනීම් පිලිබඳ සම්මන්ත්‍රන ඇතුලත්වේ. ජානමය අභියෝග ගැන පුළුල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විවිධ උත්සව සහ වැඩසටහන්වලට සහභාගීවීමේ අවස්ථාවද අප සාමාජිකයන්ට ලබාදෙන්නෙමු.

- ඉදිරියට පැවැත්වෙන සම්මන්ත්‍රන, සහ
- ජාන ආධාර ගැන දැනුවත් කිරීමේ සතිය (Genetic Support Awareness Week) ගැන අපෙන් විමසන්න.



## සාමාජික ඉල්ලුම්පත

මහතා මහත්මිය මෙනවිය වෛද්‍ය (මනාපය වටා රවුමක් අඳින්න)

මුල් නම:

පෙළපත් නම:

සංවිධානයේ නම: (අදාල නම්)

ලිපිනය:

ප්‍රාන්තය: තැපැල් සංකේතය:

දුරකථන අංකය (කාර්යාල): දුරකථන අංකය (නිවසේ):

දුරකථන අංකය (ජංගම): ෆැක්ස් අංකය:

ඊමේල් ලිපිනය:

සාමාජික වර්ගය:

1. තනි පුද්ගල / පවුල්: $22 ☐

2. කණ්ඩායම්: $22 ☐

3. වෘත්තීය / සේවා සැපයුම්කාර: $22 ☐

4. සහන: $11 ☐
(ශිෂ්‍ය,විශ්‍රාමික,සෞඛ්‍ය සුරැකුම්පත් හිමි Healthcare Card Holder):

තැපැල් ලැයිස්තුව පමනි අදාල නැත ☐

අත්සන:

දිනය: / /

ඔබ අප ගැන දැනගත්තේ කෙසේද?